# බස්නාහිර පළාත් සෞන්දර්ය නිකේතනය

# පුරප්පාඩු පිරවීම

බස්නාහිර පළාත් සෞන්දර්ය නිකේතනයෙහි කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 1. කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) - තනතුරු 01

**1.1 සුදුසුකම්**

1. අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී සිංහල / දෙමළ / ගණිතය යන විෂයන් හතර (04) කට සම්මාන සාමාර්ථයක් සහිතව එකවර විෂයයන් හය (06) කින් සමත්ව තිබීම.
2. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයයන් තුනක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.
3. පරිගණක වදන් සැකසුම් / යතුරු ලියන පිළිබඳ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා මාස හයකට (6) නොඅඩු පාඨමාලාවක් හදාරා තිබීම. (සනාථ කිරීම සඳහා අයදුම්පත් සමග පිටපත් අමුණා එවිය යුතු වේ)

**1.2 වයස :** අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය.

**1.3 වැටුප් පරිමාණය :** MA 1-1 රු. 27910 - 10-x7x350 - 4x495 - 20x660

(කළමනාකරණ සේවා චක්‍රලේඛ 02/2016 වර්ගීකරණයට අනුව 2020.01.01 දිනට දැනට ගෙවනු ලබන වැටුප රු. 27,910 වේ.)

**1.4 බඳවා ගැනීම :** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මත තෝරා ගැනේ.

**1.5** ඉහත සඳහන් තනතුර ස්ථිරය. සේවක අර්ථ සාධක අරමුදලට හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලට දායක විය යුතුය.

## පොදු කොන්දේසි :

i. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට බස්නාහිර පළාත තුළ වසර තුනකට වැඩි කාලයක් ස්ථිර පදිංචි වී සිටින අයකු විය යුතුය.

ii. විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතුය.

iii. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීමට අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

## අයදුම්පත් :

ඔබ විසින් සකස් කරන ලද අයදුම්පත් සහ සියලුම අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම් සනාථ කිරීමේ පිටපත් සමග **සභාපති, බස්නාහිර පළාත් සෞන්දර්ය නිකේතනය, අංක 275/74, ස්ටැන්ලි විජේසුන්දර මාවත, කොළඹ 07** යන ලිපිනයට 2021.03.02 දිනට පෙර එවිය යුතු වේ. අභ්‍යන්තර අයදුම්කරුවන් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් අයදුම්පත් යොමුකළ යුතුය. ප්‍රමාදවී ලැබෙන අයදුම්පත් හෝ අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන අතර, ලියුම් කවරයේ වම්පස ඉහළ කෙලවරේ අදාළ තනතුර සඳහන් කළ යුතුය. මෙම තනතුර සඳහා බඳවා ගැනීම හෝ නොගැනීම සම්බන්ධව අවසන් තීරණය බස්නාහිර පළාත් සෞන්දර්ය නිකේතන පාලන මණ්ඩලය සතුය.

**ශ්‍රියන්ත මෙන්ඩිස්,**
**සභාපති,**
**බස්නාහිර පළාත් සෞන්දර්ය නිකේතනය,**
**අංක 275/74, ස්ටැන්ලි විජේසුන්දර මාවත, කොළඹ 07.**

**දු.ක. 011-2081500, 0115929344**